# රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

# அரசகரும மொழிகள் திணைக்களம்

## **III** වන මට්ටම - සිංහල

## மட்டம் III – சிங்களம்

## ආදර්ශ ප්‍රශ්න

## மாதிரி வினாக்கள்

---

විශේෂ සටහන

III වන මටටම **සිංහල භාෂාවට** අදාළ විෂය නිර්දේශය හා පෙළ පොත් ඇසුරින් සකසන ලද ආදර්ශ ප්‍රශ්න කිහිපයක් විභාග අපේක්ෂකයන් වන ඔබගේ පහසුව පිණිස ඉදිරිපත් කර ඇත.

விசேட குறிப்பு

III ஆம் மட்டம் சிங்கள மொழிக்கான பாடப்பரப்பிற்கும் பாடப்புத்தகத்திற்கும் அமைவாக தயாரிக்கப்பட்ட மாதிரி வினாக்கள் சிலவற்றை பரீட்சார்த்திகளின் வசதிக்காக முன்வைக்கப்பட்டுள்ளது.

1. පහත සඳහන් වචන නිවැරදි කර ලියන්න.

    1. අද්යයන ණිවාඩු - ..............................
    2. පණ්ති වාර්ථාව - ..............................
    3. අබ්යාස පොඨ - ..............................

2. පහත වචනවලින් නිවැරදි අකුරු සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

    1. ප්‍රදාන ගණකාදිකාරි , ප්‍රධාන සණකාධිකාරි , ප්‍රධාන ගණකාධිකාරි
    2. ආරක්ෂක ඇමති , ආරක්ශක ඇමති , ආරක්ෂබ ඇමති

3. නාම ලේඛනය , නාම ලේඛණය , නාම ලේකණය

3. අකුරු මාරුකර දී ඇති වචනවල අකුරු ගලපා නිවැරදි වචනය සකස් කර ලියන්න.

1. ක්‍රියාලකාමර් - .....................................................
2. කිදිඉරීම් - .....................................................
3. ගාෂ්පානිරදනාය - .....................................................

4. හිස්තැනට ගැලපෙන වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

**(ආර්ථික, උත්සවය , හදිසි,)**

1. ............................... සංවර්ධනය
2. ක්‍රීඩා ..............................
3. .......................... ශල්‍ය කර්මය

5. පහත සඳහන් වචනවල බහුවචන පද ලියන්න.

1. වාට්ටුව - ...............................
2. ගම - ...............................
3. අක්කා - ...............................

6. පහත සඳහන් වචනවල ඒකවචන පද ලියන්න.

1. රටවල් - .............................
2. සහෝදරයෝ - .............................
3. සංගම් - ...........................

7. වරහන් තුළින් සුදුසු වචනය තෝරා හිස්තැන් පුරවන්න.

1. හෙදිය රෝගීයාට උදව් ............................... (කරයි/කරති)
2. දරුවෝ උදෑසනින් පාසල් ............................... (යයි / යති)

3. මම විභාගයට සූදානම් .............................. (වෙයි/වෙමි)

8. අකුරින් දී ඇති සංඛ්‍යා ඉලක්කමෙන් ලියන්න.

1. පන්සිය හැට හත - ..........................................................
2. තුන්සිය හතළිස් නවය - ..........................................................
3. එකසිය විසි අට - ..........................................................

9. ඉලක්කමෙන් දී ඇති සංඛ්‍යා අකුරින් ලියන්න.

1. 293 - ..........................................................
2. 1475 - ..........................................................
3. 680 - .........................................................

10. පහත සඳහන් සිංහල වචනවලට සමාන දෙමළ වචන ලියන්න.

1. ආහාර .................................
2. ඉංජිනේරුවා .................................
3. ගොඩනැගිල්ල .................................

11. පහත සඳහන් දෙමළ වචනවලට සමාන සිංහල වචන ලියන්න.

1. துடைப்பம் .................................
2. இனிய பாடல்கள் .................................
3. வரலாற்று .................................

12. වරහන් තුළ දී ඇති වචන යොදා ඡේදය සම්පූර්ණ කරන්න

( පරිවාස , භාරගත් , අභිමතය , ප්‍රතිපත්ති , චක්‍රලේඛ , සනාථ , රාජ්‍ය භාෂාව , පත්වීම , සිංහල, පහක්)

මෙම පත්වීම (1)........................................ දින සිට වර්ෂ පහක් (05) ක් ඉකුත් වීමට පෙර, රජයේ (2).................................. වලට අනුරූපව දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත් බව ඔබ විසින් (3) .................................... කළ යුතු වේ. ඔබ මෙම පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූයේ (4) .................................... භාෂාවෙන් නම් ඔබගේ දෙවන රාජ්‍ය භාෂාව වනුයේ දෙමළ භාෂාව වේ. එසේම ඔබ මෙම පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූයේ දෙමළ භාෂාවෙන් නම් ඔබගේ දෙවන (5) ....................................... වනුයේ සිංහල භාෂාව වේ. තව ද ඔබ මෙම (6) ..................................... සඳහා සුදුසුකම් සපුරාලූයේ ඉංග්‍රීසි භාෂාවෙන් නම් ඔබගේ (7) .................................. පරිදි දෙවන රාජ්‍ය භාෂාව වශයෙන් සිංහල හෝ දෙමළ යන භාෂා දෙකෙන් එක් භාෂාවක ප්‍රවීණතාව (8) ......................................... කාලය තුළ ලබාගත යුතු ය. ඉන් අනතුරුව පත්වීම භාරගත් දින සිට වසර (9) ........................ ඉකුත් වීමට පෙර අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාව ලබා ගත් යුතුය. 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන (10) .............................. 01/2014 විධිවිධාන මීට අදාළ වේ.

## 11 කොටස

### 'අ' උප කොටස

13. පහත සඳහන් ඡේදය කියවා එම කරුණු ඇසුරෙන් දී ඇති ආකෘතිය සම්පූර්ණ කරන්න.

නිකවැරටිය මහසෙන් විද්‍යාලයේ දරුවන්ගේ අධ්‍යාපන තත්වය ඉහල නැංවීමේදී විෂය පරිබාහිරව පවත්නා දුර්වලතා හඳුනා ගැනීමේ අරමුණින් විදුහල්පති හා ගුරු මණ්ඩලය කෙටි ප්‍රශ්නාවලියක් සකස් කර දරුවන්ට ලබා දීමට තීරණය කරන ලදී. ඒ අනුව 9 ශ්‍රේණියේ ඒ පන්තියේ සිසුවකු වූ සාරංගගේ විස්තර ඡේදයක් ලෙස මෙහි දක්වා ඇත. එම කරුණු ඇසුරින් සාරංග සම්පූර්ණ කරන පරිදි ප්‍රශ්නාවලිය සම්පූර්ණ කරන්න.

රංජිත් දිසානායක හා අනුලා කුමාරසිංහ මව් පියන්ට දාව සාරංග දිසානායක පවුලේ බාලයා ලෙසත් දෙවන පිරිමි දරුවා ලෙසත් 2002 මාර්තු 15 වැනිදා උපත ලැබීය. දැනට අ.පො.ස. සාමාන්‍ය පෙළ හදාරමින් සිටින අක්කා කෙනෙකුත් සහ අ.පො.ස. උසස් පෙළ සමත්ව සිටින අයියා කෙනෙකුත් සාරංගට ඇත. උපාධිධාරීන් යුවලක් වන සාරංගගේ මවුපියන් ගෞරවනීය ලෙස සමාජයේ ජීවත් වෙයි. පියා කනිෂ්ට විද්‍යාලයක විදුහල්පතිවරයෙකු වන අතර මව විද්‍යා ගුරුවරියක ලෙස මහව විජයබා විද්‍යාලයේ සේවය කරයි. මවගේ සහයෝගයද නිරන්තරව ලැබෙන බැවින් සාරංගගේ කැමතිම විෂය විද්‍යා විෂයයි. එහෙත් ඔහු සෞඛ්‍ය විෂයට එතරම් කැමති නැති බැවින් සෑම වාරයකම අඩුම ලකුණු ලබාගන්නේ එම විෂයටය. සෑම දිනකම පියාගේ මෝටර් රථයෙන් පාසලට පැමිණෙන සාරංග පන්තියේ උදෑසනින්ම පැමිණෙන සිසුන්ගෙන් කෙනෙකි.

මහසෙන් විද්‍යාලය - නිකවැරටිය.

**විෂය බාහිර ක්‍රියාකාරකම් ඉහල නැංවීමේ ව්‍යාපෘතිය**

**ශිෂ්‍ය තොරතුරු පත්‍රිකාව**

ශ්‍රේණිය ☐ පන්තිය ☐

1) ශිෂ්‍යාගේ / ශිෂ්‍යාවගේ නම :-

2) උපන් දිනය :-

3) ඉගෙනීමට කැමතිම විෂය :-

4) පසුගිය වාර පරීක්ෂණයේ දි අඩුම ලකුණු ලබාගත් විෂය :-

5) පියගේ නම :-

6) මවගේ නම :-

7) 1. පියා හෝ මව නොමැතිව වෙනත් භාරකරුවකු වේ නම් ඔහුගේ / ඇයගේ නම :-

2. ඔබට ඇති ඥාතිත්වය :-

8) පාසලට පැමිණෙන ක්‍රමය :-
(අදාල කොටුව තුළ √ ලකුණ දමන්න)

| | |
|---|---|
| බසය | ☐ |
| පාසල් වෑන් රථය | ☐ |
| බයිසිකලය | ☐ |
| පයින් | ☐ |
| වෙනත් | ☐ |

9) පියාගේ රැකියාව :-

මවගේ රැකියාව :-

භාරකරුගේ රැකියාව :-

10) පවුලේ සහෝදර සහෝදරියන් පිළිබඳ විස්තර :-

සහෝදරයන් සංඛ්‍යාව ☐ සහෝදරියන් සංඛ්‍යාව ☐

11) පාසල් යන සහෝදර සහෝදරියන් ගණන :-

12) පවුලේ ඉහළම අධ්‍යාපනයක් ලැබූ තැනැත්තන් කවුද :-

13) ඒ කුමන මට්ටමක්ද?

- 10 ශ්‍රේණිය දක්වා ☐
- අ.පො.ස. සා.පෙළ සමත් ☐
- අ.පො.ස. උ.පෙළ සමත් ☐
- උපාධිධාරි ☐
- ඊට ඉහල ☐

## 'ආ ' උප කොටස

14. පහත තොරතුරු ඇසුරින් කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ඇලවීම සඳහා දැන්වීමක් සකස් කරන්න.

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන පරිපාලන නිලධාරී ගුණදාස සමරවීර මහතා 2016 දෙසැම්බර් මස 29 වැනි දින විශ්‍රාම ගැනීමට නියමිතය. ඒ වෙනුවෙන් සැමරුම් උත්සවයක් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සේවක සුබසාධක සංගමය විසින් සංවිධානය කර ඇත. මෙම සැමරුම් උත්සවය එදින පෙරවරු 10.00 සිට පස්වරු 4.00 දක්වා දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ. මේ සඳහා දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ට සහභාගි වන ලෙස සුබසාධක සංගමයේ උත්සව සංවිධාන කමිටුව ආරාධනා කරයි.

........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

....................................................................................................

## 'ඇ ' උප කොටස

15.පහත සඳහන් මාතෘකා අතුරින් **<u>එකක්</u>** තෝරා ගෙන සංවාදයක් ලියන්න. ලිවීම සඳහා කථන සිංහල භාෂාව භාවිත කළ හැකිය. එක් පිළිතුරකට දෙදෙනෙකු අතර සිදු වන සංවාද කොටස් පහ බැගින්වත් තිබිය යුතුය.

1) පාසලට පැමිණීම දුර්වල ශිෂ්‍යයෙකුගේ මව හෝ පියා සමඟ පංතිභාර ගුරුවරයා කරන සංවාදයක්.

2) ඔබගේ පියාට හදිසි හෘදයාබාධයක් වැළඳී රෝහල් ගත කර ඇත. පියාගේ රෝගී තත්වය ඇති වූ ආකාරය පිළිබඳ වෛද්‍යවරයාට විස්තර පවසමින් රෝගියාගේ වත්මන් තත්වය පිළිබඳ වෛද්‍යවරයාගෙන් විමසීමට කරන සංවාදය.